**ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාව - 2020**

------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.1 මතය ව්‍යාචනය කිරීම

--------------------------

ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණයවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

---------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගනන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ඉකුත් වර්ෂයේ ආරම්භක ශේෂ ඉදිරියට ගැනීමේ දී වත්කම් හා වගකීම් ශේෂ 17 ක වටිනාකම රු.3,647,784 ක් වැඩියෙන් ද වත්කම් හා වගකීම් ශේෂ 10 ක වටිනාකම් රු. 2,993,931 ක් අඩුවෙන් ද දක්වා තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද අවසන් ගිණුමෙහි ආරම්භක ශේෂ ගෙන ඇත්තේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන දෙවනුව සකස් කළ අවසන් ගිණුමේ ශේෂ බව කාරුණිකව දන්වා සිටින අතර එම හේතුවෙන් වත්කම් ගිණුම් වගකීම් ගිණුම් ශේෂවල අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම් පවතී. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ප්‍රාග්ධන වත්කම් වැඩිවීම හා නඩත්තු වියදම රු.475,069 ක් හා වෙනත් සේවා යටතේ වූ වියදම රු.21,130 ක් හා ආදායම් ආධාර පුනරාවර්තන ලැබීම් රු.319,850 ක් ද සතිපොල බදු ආදායම රු.63,200 ක් ද ආදායම් වියදම් ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි. | රු.475,069 රක්ෂණයෙන් ප්‍රතිපූර්ණය වූ බැවින් පෙරගෙවුම් ගිණුමේ දක්වා ඇති අතර රු.21,130 වැඩියෙන් වැය ශීර්ෂ ගත වී තිබුණු මුදලකි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් හා ආධාරවලින් දායකවීමේ ගිණුම්වල එකතුව ස්ථාවර වත්කම්වලට සමාන විය යුතු වුව ද එම ශේෂයන් දෙක අතරරු.4,093,098 ක වෙනසක් විය. | මේ සම්බන්ධව 2017 සිට 2020 දක්වා වූ වර්ෂ තුනේදී මෙන්ම ඊට පෙර වර්ෂවල සිටම මෙම වෙනස පැවති බැවින් වෙනස සකස් කළ හැකි ආකාරය සම්බන්ධව විෂයය දැනුම ඇති සුදුසු නිලධාරියෙකු වෙතින් උපදෙස් ලබාගෙන ගැලපීම් සිදු කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනස ගලපා මූල්‍ය ප්‍රකාශන නිවැරදිව කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | ඉකුත් වර්ෂයේ දී පරිත්‍යාග ලෙස ලද රු.2,801,950 ක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල සහ රු.532,385 ක වටිනා ලී බඩු හා සවි කිරීම්වල එකතුව රු.3,334,335 ක් ප්‍රාග්ධන යෙදවුමට ආධාරවලින් දායක වීමේ ගිණුමට සටහන් කර නොතිබුණි. | ඉකුත් වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලද වටිනාකම් ප්‍රාග්ධන ආදායමෙන් දායක වීමේ ගිණුමට ඇතුළත් කර තිබීම ඉකුත් වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේ සකස් කරන ලද්දේ මූලික දැනුවත් භාවයක් නොමැති වීම මෙම වැරදි ලෙස සටහන් වීමට හේතු වී ඇති බව | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | රු.900,000 ක් වූ ප්‍රාග්ධන වියදම් ද රු.500,000 ක ණයගැති ශේෂයක් ද රු.32,000 ක නොපියවූ අත්තිකාරම් ද වෙනත් ලැබීම් රු.678,610 ක් ද දෙසැම්බර් මස රු.20,000 ක වැටුප් ද ගබඩා භාණ්ඩ 38ක වටිනාකම ද මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී මෙම අඩුපාඩුව නිවැරදි කරගන්නා බව. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | ආපසු ගෙවිය යුතු රු.134,304 ක විවිධ තැන්පත් ද වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.79,684 ක් ද ජංගම ගිණුමේ වර්ෂ අවසාන මුදල් ශේෂය රු.14,657ක් ද, මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී මෙම අඩුපාඩුව නිවැරදි කරගන්නා බව. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (උ) | සභාව සතු යතුරු පැදි දෙකක්, ට්‍රැක්ටර් ටේලර් 3ක් හා පරිත්‍යාග ලෙස ලැබී තිබූ ස්ප්‍රේ යන්ත්‍ර දෙකක් තක්සේරු කර එම වටිනාකම් ගිණුම් ගත කර නොතිබුණි. | මේවායේ වටිනාකම් තක්සේරු කර 2021 වර්ෂයේ ගිණුම්ගත කරන බව. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 14 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල ශේෂය හා අදාළ අනුරූපී වාර්තාවල ශේෂය අතර එකතුව රු.18,784,197 ක වෙනසක් පැවතුණි. | හැකි ඉක්මනින් සිද්ධි දෝෂ නිවැරදි කරන බව. | වෙනස ගලපා මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂය රු.1,591,753 ක වෙනසක් පැවති අතර මුදල් ගිණුමේ රු.405,322 ක වෙනස මෙම ගිණුමට ගැළපීම ද නිසා අවසාන ශේෂය වූ රු.2,240,195 ක වටිනාකම නිවැරදි නොවේ. | ආරම්භක ශේෂය රු.1,834,873 ක් වූ බැවින් ද, මුදල් ගිණුම නිවැරදි නොවීම නිසා වූ වෙනස් ගැළපීම් ද හේතුවෙන් අවසාන ශේෂය එම අගයක් ගෙන ඇති බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 12 කට අදාළව එකතුව රු.31,394,900 ක් ස්ථාවර වත්කම් ලේඛන, උපලේඛන, ඔප්පු සනාථ කිරීම් වැනි සාක්ෂි නොමැති වීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | හැකි ඉක්මනින් උපලේඛන සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | විගණනයට අවශ්‍ය සියලු තොරතුරු ඉදිරිපත් කළ යුතු වීම. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි අංක 570 හා 571 | තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් වූ ඉක්ම වූ රු.1,483,210 ක් වූ තැන්පතු ශේෂ 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | විගණන කමිටුවේ නිර්දේශ ලබාගෙන හැකි ඉක්මනින් සුදුසු පියවර ගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.718,897 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,567,646 ක් විය. පුනරාවර්තන ලැබීම් මිලියනයකින් අඩුවීම සහ ගිණුම්කරණ දෝෂ මීට ප්‍රධාන හේතු ලෙස නිරීක්ෂණය විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පවත්වාගෙන ගිය රු. 556,290 ක ස්ථාවර තැන්පතු හා ඊට අදාළ පොලී මුදල් නිදහස් කරගෙන තිබුණ ද ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | වරදක් බව පිළිගන්නා අතර ඉදිරියේ එවැනි අතපසුවීම් මඟහරවා ගැනීමට කටයුතු කරන බව. | මහ සභා අනුමැතිය මත කටයුතු කළ යුතු වීම. |

## 2.3 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජල ගාස්තු | | |
| 2020 ජනවාරි 01 දිනට ජල ගාස්තු හිඟය රු. 536,779 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ දී එම හිඟයෙන් රු. 65,346 ක් අයකරගෙන තිබුණි. ජල මනු විසන්ධි කිරීම හා රජයේ ආයතනවලින් ජල ගාස්තු අය නොවීම මෙයට ප්‍රධාන හේතු ලෙස නිරීක්ෂණය විය. | ජල ගාස්තුවලින් වැඩි ප්‍රතිශතයක් මොරගහකන්ද ව්‍යාපෘතියට යටවුණු ප්‍රදේශවල වේ. හැකි ඉක්මනින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය අනුව හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 10 ක් තුළ ගාස්තු ගෙවා තිබූ ව්‍යාපාර 05 ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබීම, තොරතුරු නොලැබීම මත ව්‍යාපාර 08 ක බලපත්‍ර දීම අත්හැර තිබීම, අඩුපාඩු සහිත ව්‍යාපාර 08 ක් සඳහා බලපත්‍ර නිකුත් කර තිබීම, ව්‍යාපාර 04 ක බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදයක් හා බලපත්‍ර අලුත් කිරීමකින් තොරව වෙළඳ බලපත්‍ර 10 ක් නිකුත් කර තිබීම නිසා වෙළඳ බලපත්‍ර මත ව්‍යාපාර පවත්වාගෙන යාමෙන් පාරිසරික ගැටළු ඇතිවිය හැකි බවට නිරීක්ෂණය වේ. | සිදුව ඇති සියලු අඩුපාඩු මේ වන විට සකස් කරමින් පවතින බව. | පරිසර පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවට අයත් කැබ් රථයක අනතුර සම්බන්ධයෙන් ප්‍රතිපූර්ණය නොවූ රු.373,323 ක අලාභය අය කර ගැනීමේ වගකීම් නිශ්චය කිරීමේ මු.රෙ. 104(4) අවසන් වාර්තාව අනතුර සිදුවී මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 පෙබරවාරි 21 දින වන විට අනතුර සිදු වී වසරක් ඉක්මවා තිබුණද එම අලාභය අය කර ගෙන නොතිබුණි. | අලාභය අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |